
# මුල්ලා නස්රුදීන් සහ ඔහුගේ කතා




නස්රුදීන්ගේ කතා බොහෝ ඉස්ලාමීය සමාජවලත් එයට අමතරව ඇමරිකාවේ, රුසියාවේ, ඉන්දියාවේ හා චීනයේ ද විවිධ ආගමික හා සංස්කෘතික සමාජවල ජනයා අතරද ජනප්‍රිය වී ඇති ජනකතා ගනයට දැමිය හැකි කතාවල් වෙති.

මුල්ලාවරයෙකු එක්තරා මට්ටමක මුස්ලිම් පූජක වරයෙකි. විවාහවී සිය පවුල සමග ගමේ සාමාන්‍ය මිනිසුන් අතරේම ජීවත්වන මුල්ලා විශේෂ වූයේ ඔහු පතපොත උගත්, යම් ආගමික පුහුණුවක් ලද, ගමේ මිනිසුන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමේ වගකීම දැරූ අයෙකු වීම නිසාය.

මධ්‍යකාලීන යුගයේ පර්සියානු (අද ඉරානය) සමාජයේ සිටියෙකු ලෙස පිළිබිඹු කෙරෙන නස්රුදීන් චරිතය වටා කතා රාශියක් ගෙතී ඇත.

බොහෝ විට එක ඡේදයක් පමණකින්ද, විටෙක කෙටි සිද්ධියක් වශයෙන්ද ගෙතුණු මේ රසවත් කතා ජන ජීවිතයේ සිතුම් පැතුම් වලට ළඟින්ම සම්බන්ධ වූ නිසා ඉතා ජනප්‍රිය වී තිබේ. ඕනෑම සමාජයක ජනයා අතර ඇති මෝඩකම්, පණ්ඩිතකම්, කපටිකම් හා පුරසාරම් ආදිය ඇත ඒ දේවල් හාස්‍ය රසයෙන් අනූනව සැහැල්ලු ලෙස පිළිඹිබු කරමින් ගෙතුණු අතර බොහෝ විට නස්රුදීන් විසින්ම විඳ ලබන අත්දැකීම් ලෙස විස්තර වෙයි. කිසියම් ඓතිහාසික යුගයකට හෝ පරිසරයකට සීමා නොවී සෑම මිනිස් සමාජයකම කවදාටත්, කොතැනටත් ඉතා ගැලපෙන බැවින් සරලය, රසවත්ය.



ඉද්රිස් අබුතාහිර් ෂා

## ඉද්රිස් අබුතාහිර් ෂා

මේ කතා ගොතා නස්රුදීන් චරිතය ගොඩනැගුවේ ඉද්රිස් ෂා විසිනි. ඔහු ද පෙරදිගට මෙන්ම, අපරදිගටද සම්බන්ධ පුද්ගලයෙකි. ඉද්රිස්ගේ පියා සුන්නි ඉස්ලාම් භක්තිකයෙකු වීය. පිය පාර්ශ්වය මහම්මත් තුමා දක්වා අතීතයට දිවයන සම්බන්ධයකට හිමිකම් කීවෝ වූහ. ඒ පුද්ගලයාට දාව ස්කොට්ලන්ත මවකට 1924 දී උතුරු ඉන්දියාවේ සිම්ලා නගරයේදී උපන් ඉදිරිස් ද රැගෙන ඔහු ළදරු වියේදීම එංගලන්තයට පැමිණි ඒ දෙමාපියෝ ඔහු සුන්නි ආගමික පිළිවෙත් අනුව ඇතිදැඩි කළෝය.

ඔක්ස්පර්ඩ් නගරයේ පාසැල් ගොස් හොඳ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලත් ඉදිරිස් ෂා වයස අවුරුදු 30 පමණ වූ පසු සුන්නි ඉස්ලාම් ආගම ගැන ගැඹුරින් හදාළේය. ඉස්ලාමීය ආගමික හා සංස්කෘතික ප්‍රශ්න අළලා ඉංග්‍රීසියෙන් පොත් තිස් ගණනක් ලියා ඇති ඔහු එවකට එම දර්ශනය පිළිබඳ හසල උගතෙකු ලෙස බටහිර මෙන්ම, පෙරදිගද ප්‍රසිද්ධ විය. ජනප්‍රිය කථිකයෙකු වූ ඉදිරිස් බොහෝ රටවල් හි සැර-සරමින් දේශන පැවැත්වීය. නස්රුදීන් කතා නිසා පොදු ජනයා අතර ජනප්‍රිය වූ ඔහු 1996 දී මියගියේ ය.

මේ සමග දැක්වෙන්නේ නස්රුදීන් ගේ කතා වලින් දෙකකි.

## නැතිවුණු යතුර

දවසක් රෑ නස්රුදීන් පාර අයිනෙ ලයිට් කණුවක් යට පහත්වෙලා මොනවද හොයනවා. එය මිනිස්සු කඩපළට ගොහිං ගෙදර බලා යන වෙලාව.

" මොනවද නස්රුදීන් ඔය හොයන්නෙ....? " එතනින් යන මිනිහෙක් ඇහුව.

" මගේ ගෙදර යතුර නැතිවුනා නේ.... ඒ යතුරයි මං මේ හොයන් නෙ.... දැන් හරි වැඩේ... මට ගෙදර ගිහිං දොර ඇරගන්න විදියක් නෑ.... අද මං කොහොම හරි මේක හොයාගන්න ඕන.... "

නස්රුදීන් කිව්වා.

ඒපාර අර මිනිහත් යන්න ගිය ගමන නවත්තලා යතුර හොයන්න පටන් ගත්ත.

ටික වෙලාවක් යනකොට මිනිස්සු කණුව යට බිම අවුස්ස අවුස්ස නස්රුදීන් එක්ක එකතුවෙලා යතුර හොයනව. ඔහොම පැයක් විතර සොයලා මහන්සි වෙච්ච ඒ එක මිනිහෙක් ඇහුවා,

" කෝ මෙච්චර බලලත් යතුර නැනේ... හොඳටම විස්වාසද නස්රුදීන් යතුර මෙතනම වැටුණායි කියලා...? "

" නෑ මෙතන නෙවෙයි යතුර වැටුනෙ...... අන්න අතන...."

නස්රුදීන් ටිකක් ඈත කළුවර තැනකට අත දික් කරල පෙන්නලා කිව්වා. මිනිස්සුන්ට හරි කේන්තියි.

" යතුර වැටුනෙ එතන නම් මොන කෙහෙම්මලටද මෙතන දමාගෙන හොයන්නෙ....? ඒ වැටිච්ච තැනනේ හොයන්න ඕන......" මිනිස්සු කිව්වා.

" ඉතිං එතන ලයිට් එකක් නෑ.... කරුවලයි නේ.... මෙතන නේ ලයිට්ට එක තියෙන්නෙ.... ඒකයි මේ මෙතන හොයන්නෙ....".

නස්රුදීන් කිව්වා.

## ස්ථිර වචනය

" නස්රුදීන් උන්නැහේ ඔහේගෙ වයස කීයද... ?"

" හතළිස් පහයි..."

" දැනට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා ඇහුවමත් ඔහේ කිව්වෙ ඔය වයසම නේද?

" ඔව්! මම කවදාවත් වචන දෙකක් කියන මිනිහෙක් නෙවෙයි නේ .... "

නස්රුදීන් පිළිතුරු දුන්නා.

♦ **වකුල ගුණපාල**
**Ilford Essex UK**

# FAST CASH අනුග්‍රහයෙන් එක්සත් රාජධානියේ ශ්‍රීලංකා පාපන්දු සැණකෙළිය






**From left : Mr Upali Jothiratne - the President of SLFA (UK) Mr Mike Cooke, Chairman of Fastcash, H.E. Justice Nihal Jayasinghe - the Sri Lanka's High Commissioner in the UK and Mr Ananda Thevadaasan -Hony. Secretary of SLFA (UK)**

The 5th annual Sri Lanka Football Festival was held in North London on 24 Sep.2009. The event was exclusively sponsored by Fast Cash - the biggest Sri Lankan business group in the UK. 22 teams participated in this festival on an excellent Summer Day that attracted a large crowd of true football lovers from Sri Lankan expat. community.



**The Cup winners of the Football Festival Colombo's Gunasinghe Pura OBA with club's President - Mr Ranjith Katuwana (left)**

ගිය මස එනම් සැප්තැම්බර් 27 වෙනි ඉරුදින ලන්ඩනයේ ශ්‍රී ලාංකික ජන සමූහයාට අමතක නොවන විශේෂ දිනයක් වූයේ එදින එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා පාපන්දු සංගමය විසින් 5 වන වරටත් සංවිධානය කරන ලද දැවැන්ත පාපන්දු සැණකෙළිය උතුරු දිග ලන්ඩනයේ වින්ච්මෝහිල් ක්‍රීඩාංගනයේ පැවත්වීමයි. මේ සඳහා මූලික අනුග්‍රහය ලන්ඩනයේ ප්‍රධාන පෙළේ මුදල් සේවා ආයතනයක් වන f පාස්ට්කැෂ් සමාගම වෙතිනි. මෙම පාපන්දු සැණකෙළියේ ප්‍රධාන අමුත්තා වූයේ බ්‍රිතාන්‍යයේ ශ්‍රීලංකා මහකොමසාරිස්වර ගරු විනිසුරු නිහාල් ජයසිංහ මැතිතුමා ය.

සූර්යාලෝකයෙන් බැබළෙන එම උණුසුම් දිනයේ පාපන්දු කණ්ඩායම් 22 ක් තරඟයට පිවිසුණෝය. ඒ අතරින් ජයග්‍රාහී කුසලාන දිනන ලද්දේ කොළඹ ගුණසිංහපුර විද්‍යාලීය පාපන්දු කණ්ඩායම විසිනි. තරඟ වැදුණු සියළුම කණ්ඩායම් වලට කුසලානය බැගින් ප්‍රදානය කෙරිණ.

මෙම පාපන්දු සැණකෙළිය සංවිධානය කළ එක්සත් රාජධානියේ ශ්‍රීලංකා පාපන්දු සංගමයේ මූලික අරමුණ වනාහි ශ්‍රීලංකාවේ පාසැල්වල සහ ජනතාව තුළ පාපන්දු කෙරෙහි උනන්දුවක් ඇති කරවා එමගින් අද අප රටේ ක්‍රිකට් ක්‍රීඩාවට ඇති ජනප්‍රියත්වයම පාපන්දුවටද අත්කර දී අනාගතයේ දී ශ්‍රීලංකාවෙන් කීර්තිමත් ජාත්‍යන්තර ක්‍රීඩකයින් බිහිකර වීම බව සංගමයේ සභාපති උපාලි ජෝතිරත්න මහතා ලංකාවිත්ති යට පැවසීය. එය එසේම වේවායි! පතමු.




Purchase AIR TICKETS OR HOLIDAY PACKAGES from Holiday Air and Send money worldwide for FREE

www.HOLIDAYAIR.com 0208 440 0770

The No. 1 Agent to Sri Lanka

Do not book your Air Ticket with any other travel agent until you speak to us!

Selected Date Offer | Best Value Deals - Colombo

SriLankan £320 +Taxes Sep / Oct / Nov 2009
SriLankan £420 +Taxes December 2009
SriLankan £350* + Taxes including free stopover India / Hong Kong / Tokyo / Beijing / Singapore / Bangkok / Kuala Lumpur 11 Aug. - 09 Dec. 2009
OMAN AIR £165 +Taxes 15 Oct. - 30 Nov. 2009
KUWAIT AIRWAYS £200 +Taxes 04 Aug. - 09 Dec. 2009
QATAR AIRWAYS £300 +Taxes 16 Aug. - 15 Sep. 2009

ATOL PROTECTED 9425 IATA

Unbeatable worldwide fares now available on our 24-hour online booking system
96 High Street, Barnet, Herts EN5 5SN
Open 6 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm Closed- Sunday & Bank Holidays

Strong. Safe. Reliable. MCG Mike Cooke Group

*Terms and Conditions Apply **Date-Specific Promotional Fare